සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,675 - 2010 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා - 2010.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1612 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1616 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1618 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## කටුනායක සීදූව නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කටුනායක සීදූව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර "ලේකම්, කටුනායක සීදූව නගර සභාව, සීදූව" යන ලිපිනයට 2010.11.08 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතුය.) අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| ආයුර්වේද කම්කරු III පංතිය | 01 | 11,730–10x120–10x130–10x145–12x160–17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබිය යුතුය. |
| ජල වැද්දුම්කරු (අර්ධ ශිල්පීය II | 01 | 12,210–10x130–10x145–10x160–12x170–18,600 | අ.පො.ස (සා.පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම |
| මාර්ග කම්කරු III පංතිය | 02 | 11,730–10x120–10x130–10x145–12x160–17,600 | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත්වී තිබීම. |

04. *වයස් සීමාව* .- ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

05. *පොදු සුදුසුකම්* ඃ

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iii) පූර්වාසන්න වසර 3ක කාලයක් අවම වශයෙන් අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය. (කටාන මැතිවරණ කොට්ඨාශය තුළ පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* ඃ

සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* .- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නව බඳවා ගැනීම් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය.
(iii) අධ්‍යාපන සහතික,

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල කටුනායක සීදූව නගර සභාවේ ලේකම් සතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ඒ බැව් ලිඛිතව දන්වනු ලැබේ.

ඩී. පී. සෝමසිරි,
ලේකම්,
කටුනායක සීදූව නගර සභාව.

කටුනායක සීදූව නගර සභාව

-------------- ***තනතුර සඳහා අයදුම් කිරීම***

01. *(අ)* මුලකුරු සමග නම:————————,
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————,

02. ජාතික හැඳුනුම්පත් අංකය:—————————,
03. (අ) ස්ථිර පදිංචි ලිපිනය:—————————,
දුරකථන අංකය:—————————,
(ආ) කාර්යාලීය ලිපිනය:—————————,
දුරකථන අංකය:—————————,
03. (i) උපන් දිනය:—————————,
(ii) 2010............. දිනට වයස :
අවුරුදු:—————, මාස:————, දින:—————,
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :—————————,
05. විවාහක/අවිවාහක බව:—————————,
06. ස්ත්‍රී/පුරුෂ භාවය:—————————,
07. අධ්‍යාපන සුදුසුකම්:—————————,
08. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :—————————,
09. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද ? එසේ නම් එම විස්තර:—————————,

ම විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————————,

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන*

මෙම ආයතනයේ ------------------------තනතුර දරන ------------------------ මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

—————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය:—————————,

10-381

---

**තංගල්ල ප්‍රාදේශීය සභාව**

**(දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම)**

තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට සහ තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේතය/ වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු 11 (ආ) | 02 | PL-3-2006/A<br>රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 | අටවන ශ්‍රේණිය (නවවන වසර) සමත් විය යුතුය. මගී ආසන 26ට වැඩි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා තිබිය යුතුය. ("ඒ" පන්තියේ බලපත්‍රයක්) වාහන රියදුරකු වශයෙන් වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 02 | පුස්තකාල සහායක | 02 | PL-1-2006/A<br>රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | අටවන ශ්‍රේණිය (නව වන වසර) සමත් විය යුතුයි. |
| 03 | කාර්යාල කාර්ය සහායක | 01 | PL-1-2006/A<br>රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | අටවන ශ්‍රේණිය (නව වන වසර) සමත් විය යුතුයි. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය/ වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 04 | බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම) | 01 | දෛනික වැටුප් රු 415.66ක් ජීවන වියදම් දීමනාව | අටවන ශ්‍රේණිය (නව වන වසර) සමත් විය යුතුයි. මගී ආසන 26ට වැඩි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා තිබිය යුතුයි. ("ඒ" පන්තියේ බලපත්‍රයක්) වාහන රියදුරෙකු වශයෙන් වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 05 | පොළ භාරකරු (කොන්ත්‍රාත් පදනම) | 01 | දෛනික වැටුප රු. 391.00 ජීවන වියදම් දීමනාව | අටවන ශ්‍රේණිය (නව වන වසර) සමත් විය යුතුයි. |
| 06 | සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 01 | දෛනික වැටුප රු. 391.00 ජීවන වියදම් දීමනාව | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

01. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
02. අයදුම්කරු දකුණු පළාත තුල අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනකට වැඩි කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
03. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුයි.
04. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

03. *වයස් සීමාව :-*

ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-

01. අනු අංක 04,05,06 යටතේ දැක්වෙන තනතුරු හැර අනෙකුත් තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්වේ.
03. රියදුරු තනතුරු සඳහා බඳවා ගනු ලබන අය කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.
(මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම මැනීම පරීක්ෂණයකින් සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයකින් සමන්විතය.)
04. දැනටමත් ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අය තෝරාගනු ලැබුවහොත් ඔවුන්ට ගෙවන වැටුප් හා දීමනා එකී ගිවිසුම්වලට යටත් වනු ඇත.
05. ඒ ඒ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිවල නියෝගවලට අමතරව, ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට සහ දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

05. *අයදුම්කළ යුතු පිළිවෙල :-*

01. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති ප්‍රකාරව ( A 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන) පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, තංගල්ල ප්‍රාදේශීය සභාව, නෙටොල්පිටිය" යන ලිපිනයට 2010.10.29 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.
02. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "............................................" තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.
03. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුයි.
04. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.
05. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් එවිය යුතුයි. සහතිකවල මුල්පිටපත් පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුයි.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රා. නි. සහතිකය;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් ;

(v) වෘත්තීය සුදුසුකම් සහතිකය;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

වී. ජී. නන්දතිලක,
ලේකම්,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 20 වැනි දින,
නෙටොල්පිටිය,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**තංගල්ල ප්‍රාදේශීය සභාව**

---------------*තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම:————————,
02. මුලකුරු සමග නම:————————,
03. ස්ථිර ලිපිනය:————————,
04. උපන් දිනය: අවුරුද්ද:——————, මාසය:————, දිනය:—————,
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:———— , මාස :————, දින:———— ,
06. ස්ත්‍රී/පුරුෂ භාවය:————————,
07. විවාහක/අවිවාහක බව:————————,
08. ජාතිය/ආගම:————————,
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචි වීමෙන් යන වග :————————,
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය:————————,
11. අධ්‍යාපන සුදුසුකම්(සහතික පිටපත් අමුණා එවන්න):————————,
12. වෙනත් සුදුසුකම්:————————,
13. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————,
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) :————————,
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියකින් වරදකරුවෙකු වී තිබේ ද ?

අනාවරණය වුවහොත්, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————,

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත්, ........................................................................................ වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————.

10-401
F2 - B 80160 (S/E)

# පළාත් පාලන නිවේදන

## කඩුගන්නාව නගර සභාව

වරිපනම් බදු මුදල් - 2011 වර්ෂය

නගර සභා ආඥාපනතේ (225 අධිකාරය) 160 වගන්තිය අනුව පැවරී ඇති බලතල ප්‍රකාර කඩුගන්නාව නගර සභා ප්‍රදේශයේ පහත සඳහන් උපලේඛනවල ඇතුළත් ප්‍රදේශවල වූ දේපලවල වාර්ෂික වටිනාකමින් එකී උපලේඛනයේ සඳහන් සියයට ප්‍රමාණ අනුව වරිපනම් බද්දක් 2011 වර්ෂය සඳහා පනවා 2011 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකින් අයකර ගැනීමට තීරණය කර ඇති බව ද, එකී කාර්තු අවසන් වීමට පෙර අදාල බදු මුදල් ගෙවිය යුතු බවට ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය 01

*කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය (පැරණි)*

කොට්ඨාස අංක 01

| | |
|---|---|
| අලගල්ල පාර වම | වරිපනම් අංක 03 |
| ගම්පල පාර දකුණ | වරිපනම් අංක 04-10 |
| කැගල්ල පාර වම | වරිපනම් අංක 05-89/1 |
| කැගල්ල පාර දකුණ | වරිපනම් 08-42 |
| තානායම පාර වම | වරිපනම් 03-23 |

කොට්ඨාස අංක 02

| | |
|---|---|
| අලගල්ල පාර වම | වරිපනම් අංක 05-65 |
| අලගල්ල පාර දකුණ | වරිපනම් අංක 04-50/2 |
| නුවර පාර වම | වරිපනම් අංක 05-119/4 |
| නුවර පාර දකුණ | වරිපනම් අංක 226-250 |

කොට්ඨාස අංක 03

| | |
|---|---|
| ගම්පල පාර වම | වරිපනම් අංක 01-65/3 |
| නුවර පාර දකුණ | වරිපනම් අංක 04-48 |

කොට්ඨාස අංක 04

| | |
|---|---|
| නුවර පාර දකුණ | වරිපනම් අංක 50-218 |

කොට්ඨාස අංක 05

| | |
|---|---|
| නුවර පාර වම | වරිපනම් අංක 121-259 |
| නුවර පාර දකුණ | වරිපනම් අංක 252-362 |

කොට්ඨාස අංක 06

| | |
|---|---|
| නුවර පාර වම | වරිපනම් අංක 261-375 |
| නුවර පාර දකුණ | වරිපනම් අංක 370-536 |

වාර්ෂික වරිපනම් ප්‍රතිශත

| | |
|---|---|
| 01. සියළුම නේවාසික ස්ථාන | 8% |
| 02. සියළුම ව්‍යාපාරික ස්ථාන | 10% |
| 03. සියළුම කුඹුරු | 14% |
| 04. සියළුම ගොඩ ඉඩම් | 15% |

### උපලේඛනය 02

*යටිනුවර ප්‍රාදේශීය සභාවෙන් පවරා ගන්නා ලද නව බල ප්‍රදේශය*

| | | වාර්ෂික වරිපනම් ප්‍රතිශතය |
|---|---|---|
| 01. | කොළඹ නුවර පාර (වම) වරිපනම් අංක 205 සිට 811 දක්වා | 10% |
| 02. | කොළඹ නුවර පාර (දකුණ) වරිපනම් අංක 210 සිට 756 දක්වා | 10% |
| 03. | අලගල්ල පාර පොත්තපිටිය (වම) වරිපනම් අංක 02 සිට 48/1 දක්වා | 4% |
| 04. | අලගල්ල පාර පොත්තපිටිය (දකුණ) වරිපනම් අංක 05 සිට 53 දක්වා | 4% |

අදාල වරිපනම් බදු මුදල් ඒ ඒ කාර්තුව තුළ ගෙවනු නොලැබුවහොත් ඒ ඒ කාර්තුව සඳහා ගෙවනු ලැබිය යුතු වරිපනම් බදු මුදලින් සියළුම නේවාසික ස්ථාන සඳහා 15%ක් හා ව්‍යාපාරික ස්ථාන සඳහා 20%ක වරෙන්තු ගාස්තුවක් ද, අමතරව අය කරනු ලැබේ.

ඉහත අංක 01 හා 02 උපලේඛනවල සඳහන් පරිපනම් බදු මුදල් එකවර 2011 ජනවාරි මස 31 වැනි දින ප. ව. 3.30ට පෙර ගෙවනු ලැබුවහොත් එකී වරිපනම් බදු මුදලින් 10%ක වට්ටමක් ද එම වරිපනම් බදු මුදල් කාර්තු වශයෙන් ගෙවන්නේ නම් අදාල කාර්තුවේ පළමුවන මස වැඩ කරන අවසාන දින ප. ව. 3.30ට පෙර ගෙවනු ලැබුවහොත් එකී වරිපනම් බදු කොටස් මුදලින් 5%ක වට්ටමක් ද අඩු කරනු ලබන බව ද මෙයින් දන්වනු ලැබේ.

එස්. කේ. අබේසිරිවර්ධන,
සභාපති,
කඩුගන්නාව නගර සභාව.

2010 සැප්තැම්බර් මස 20 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

10-273

---

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ එවකට පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබ 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ

පළකරන ලද්දා වූ වයඹ පළාත් සභාව විසින් 1990.03.24 දින සාකච්ඡා කරන ලදුව අනුමත කර 1990.09.28 වැනි දින අංක 630 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකරන ලද්දා වූ අංක 01 සිට 42 දක්වා වූ පොදු අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවන දින සිට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ක්‍රියාත්මක කිරීමටත් 2010.07.30 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ මහ සභා තීරණ අංක 5/02 යටතේ සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. ජී. ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව ඉබ්බාගමුව.

2009 සැප්තැම්බර් මස 15 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-324

---

### කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැඩි දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන ඇති ප්‍රදේශ වලින් 2011 වර්ෂය සඳහා දේපලවල වාර්ෂික වටිනාකමින් 2.50%ක වරිපනම් බද්දක් අයකිරීමටත්, එම වරිපනම් බදු 2011 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනට සමාන වාරික 04කින් අයකිරීමටත්, 2011 ජනවාරි 31 දිනට ප්‍රථම මුළු මුදල ගෙවන්නේ නම් 10% වට්ටමක් ද කාර්තුවට අදාල මුදල, මුල් මාසය තුළ ගෙවන්නේ නම් 5%ක වට්ටමක් ද ගෙවීමට 2010.06.29 දින රැස්වූ කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ යෝජනා අංක 04-21 යටතේ සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(i) තවද හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට පහළොවක (15%) අධිගාස්තුවක් සහ

(ii) හිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපල සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට විස්සක් (20%) අධිගාස්තුවක් අය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2010 ක් වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-281/6

### කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලැබෙන මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරුවෙකු හෝ සේවකයෙකු හෝ වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ අන් නියෝජිතයෙකු විසින් කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 2010 ජූනි 29 වැනි දින පැවති මහ සභාවේ යෝජනා අංක 04-21 යටතේ යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2010 ක් වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-281/3

---

### මාලිම්බොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2010.05.25 දින පවත් වන ලද මහා සභා රැස්වීමේදී ගන්නා අංක 04(06) දරන තීරණය අනුව මෙහි පහත දක්වා ඇති සහ එකී උපලේඛනයේ විස්තර වන පාරවල් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබීමට සුදුසු බවට තීරණය කරනු ලැබීය.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මෙම පාරට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවය විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තුන් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වත්තිය ප්‍රකාරව ක්‍රියා කරන බව මෙයින් දැනුම් දෙනු ලබන බවත් ඉදිරි කාලයේ දී අත්පත් කර ගැනීමට ක්‍රියා කරනු ලබන බවත් දැනුම් දෙමි.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි සඳහන් හා එකී උපලේඛනයේ විස්තර වන පාරවල් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. ජී. කපිල,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

| පාරේ නම | ආරම්භය | අවසානය | දකුණුපස ඉඩම | වම්පස ඉඩම | දැනට ඇති පළල අඩි | යෝජිත පළල අඩි | යෝජිත දිග මීටර් |
|---|---|---|---|---|---|---|---|
| මැකිලිය ගහවත්ත (A කොටස) පාර | මැකිලිය ගහවත්ත | මැකිලිය ගහවත්ත කැබලි අංක 01 අසලින් | මැකිලිය ගහවත්ත කැබලි අංක 09<br>මැකිලිය ගහවත්ත කැබලි අංක 05<br>මැකිලිය ගහවත්ත කැබලි අංක 04<br>මැකිලිය ගහවත්ත කැබලි අංක 03 | මැකිලිය ගහවත්ත කැබලි අංක 10<br>මැකිලිය ගහවත්ත කැබලි අංක 11<br>මැකිලිය ගහවත්ත කැබලි අංක 12<br>මැකිලිය ගහවත්ත කැබලි අංක 02 | 10 | 12 | 120 |
| දෙද්දුගොඩ වටරවුම් පාර | තෙලෙම්බුගහ වත්ත | ගහින්ගවත්ත | තෙලෙම්බුගහවත්ත<br>ගිරුවායේගෙවත්ත<br>ගහින්ගවත්ත<br>ලොහුගෙවත්ත | අරඹෙ කුඹුර<br>හිරි කුඹුර<br>පරගහවල<br>කඳුරුගස් අද්දර<br>හිරි කුඹුර<br>ගමහාන්නැගෙ ලියැද්ද | 09 | 12 | 600 |

10-286

# විවිධ දැන්වීම්

## 2011 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අය කිරීම

### කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනවල දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තු 2011 වසර සඳහා පනවා අයකිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2010 ජුනි මස 29 වැනි දින පවත්වන ලද මහසභා රැස්වීමේ යෝජනා අංක 4-21 යටතේ යෝජනා සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම ගෙවා අදාළ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

උපලේඛන අංක 01

| අන්තරාදායක වෙළඳාම | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන ස්ථාන රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1500ට අඩු ස්ථාන රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1500 ට වැඩි ස්ථාන රු. ශ. |
|---|---|---|---|
| 01. කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම<br>02. කඩල බයිට්ස් වර්ග නිෂ්පාදනය<br>03. අයිස් පැකට් කිරීම හා අලෙවිය<br>04. අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>05. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම<br>06. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිපදවීම<br>07. තෙල් මෝලක් පවත්වාගෙන යාම<br>08. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම (කොහු මෝල්)<br>09. කොහු හෝ වෙනත් කෙඳි වලින් භාණ්ඩ නිෂ්පාදනය<br>10. ලුණු ඇඹරීම<br>11. ලී මෝලක් පවත්වාගෙන යාම<br>12. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ලී මෝලක් පවත්වාගෙන යාම<br>13. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අළුත්වැඩියාව<br>14. කම්හලක් පවත්වාගෙන යාම<br>15. හිස් ගෝනි හෝ බෝතල් ගබඩා කිරීම හා විකිණීම<br>16. පාපැදි අළුත්වැඩියා කිරීම<br>17. රතිඤ්ඤා ගබඩා කිරීම<br>18. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මුද්‍රණාලයක් සඳහා | උපරිමය 500 0 | උපරිමය 500 - 750 | උපරිමය 750 -1000 |

| *අන්තරාදායක වෙළඳාම* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1500ට අඩු ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 1500 ට වැඩි ස්ථාන* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 19. අතින් ක්‍රියාත්මක වන මුද්‍රණාලයක් සඳහා | | | |
| 20. යන්ත්‍රානුසාරයෙන් උළු නිපදවීම | | | |
| 21. භූමිතෙල් කරත්තයක් සඳහා | | | |
| 22. භූමිතෙල් බැරල් 05-10 දක්වා | | | |
| 23. භූමිතෙල් බැරල් 10 ට වැඩි | | | |
| 24. ආමේචර් එතීම (මෝටර් එතීම) | | | |
| 25. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | | | |
| 26. බැටරි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 27. රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියාව | | | |
| 28. විදුලි උපකරණ අළුත්වැඩියාව | | | |
| 29. ගෑස් පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 30. ගෑස් සිලින්ඩර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 31. ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (පෞද්ගලික) | | | |
| 32. දේශීය බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (පෞද්ගලික) | | | |
| 33. ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | | | |
| 34. දේශීය බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | | | |
| 35. දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 36. බලවේග පේෂ කර්මාන්තයක් පවත්වාගෙන යාම | | | |
| 37. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය හා ගබඩා කිරීම | | | |
| 38. වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 39. පොත් සාප්පු, ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම හා අලෙවිය | | | |
| 40. මිශ්‍ර පොහොර අලෙවි කිරීම (කෘත්‍රිම) | | | |
| 41. කෘෂි රසායනික ද්‍රව්‍ය හෝ කෘෂි උපකරණ විකිණීම | | | |
| 42. පොල් කටු අඟුරු නිපදවීම | | | |
| 43. කටු වලක් පවත්වාගෙන යාම | | | |
| 44. සිගරට්, දුම්කොළ තොග වශයෙන් පවත්වාගෙන යාම | උපරිමය | උපරිමය | උපරිමය |
| 45. සබන් නිපදවීම | 500 0 | 500 -750 | 750 -1000 |
| 46. පරණ ලෝහ භාණ්ඩ ගබඩා කිරීම | | | |
| 47. වඩුමඩුවක් පවත්වාගෙන යාම | | | |
| 48. පොල් ලී නිෂ්පාදනය කිරීම හා විකිණීම | | | |
| 49. සිසිල් බීම නිපදවීම හා ගබඩා කිරීම | | | |
| 50. රසකැවිලි නිපදවීම | | | |
| 51. කොහු ගබඩා කිරීම | | | |
| 52. කොහු කෙඳි පීරීම හා වේලීම | | | |
| 53. කොහු භාණ්ඩ නිෂ්පාදනය | | | |
| 54. කෙඳි සායම් කිරීම | | | |
| 55. තීන්ත හෝ වාර්නිෂ් කිරීම | | | |
| 56. මිරිස් ධාන්‍ය හා කෝපි වැනි කුළු බඩු ඇඹරීම | | | |
| 57. ටයර් හා ටියුබ් වෝල්කනයිසිං කිරීම | | | |
| 58. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | | | |
| 59. යන්ත්‍රානුසාරයෙන් ටයර් අළුත්වැඩියා කිරීම | | | |
| 60. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප හෝ එවැනි භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම | | | |
| 61. ෆයිබර්ග්ලාස් භාණ්ඩ නිපදවීම | | | |
| 62. සිමෙන්ති බ්ලොක්ගල් වැඩපලක් පවත්වාගෙන යාම | | | |
| 63. ගඩොල් නිපදවීම හා පිළිස්සීම | | | |
| 64. බේකරියක් පවත්වාගෙන යාම | | | |
| 65. පපඩම් නිපදවීම | | | |
| 66. කජු ගබඩා කිරීම හෝ මද නිපදවීම | | | |
| 67. කිරි අලෙවි සැලක් පවත්වාගෙන යාම | | | |
| 68. කොප්පරා නිපදවීම හා විකිණීම | | | |
| 69. කපාපු පොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 70. හුණුගල් පිළිස්සීම | | | |
| 71. බොරළු කපන ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 72. මැටි වලක් පවත්වාගෙන යාම | | | |
| 73. උත්සව සඳහා ආහාරපාන සැපයීම | | | |
| 74. භෝජනාගාරයක් පවත්වාගෙන යාම | | | |
| 75. පොල්ගෙඩි රැස්කිරීම හා විකිණීම | | | |
| 76. සිසිල් බීම හලක් පවත්වාගනෙ යාම | | | |

| *අන්තරාදායක වෙළඳාම* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1500ට අඩු ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 1500 ට වැඩි ස්ථාන* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 77. සිංහල බෙහෙත් ද්‍රව්‍ය අලෙවිය | | | |
| 78. ඇඳුම් නිෂ්පාදනය | | | |
| 79. බතික් නිෂ්පාදනය | | | |
| 80. ඇඟළුම් නිෂ්පාදනය | | | |
| 81. මිනී පෙට්ටි නිෂ්පාදනය හා විකිණීම | | | |
| 82. ලී කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| *අප්‍රසන්න ව්‍යාපාර :* | | | |
| 01. සම් පදම් කිරීම හෝ සම් ගබඩා කිරීම | | | |
| 02. සම්භාණ්ඩ නිපදවීම | | | |
| 03. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 05-25) | | | |
| 04. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 25-50 දක්වා) | | | |
| 05. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 50 ට වැඩි) | | | |
| 06. කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන් කිකිළියන් 100) | | | |
| 07. කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන් කිකිළියන් 100 ට වැඩි) | | | |
| 08. කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන් කිකිළියන් 200 ට වැඩි) | | | |
| 09. එළු පට්ටියක් පවත්වාගෙන යාම | | | |
| 10. ගව පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 05-25) | | | |
| 11. ගව පට්ටියක් පවත්වාගෙන යාම | | | |
| 12. ග්‍රොසරියක් පවත්වාගෙන යාම | | | |
| 13. කරවල ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 14. කරවල කඩයක් සඳහා | | | |
| 15. කුකුළු කෑම ගබඩා කිරීම හා විකිණීම | උපරිමය 500 | උපරිමය 500 -750 | උපරිමය 750 -1000 |
| 16. සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම | | | |
| 17. රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 18. විනාකිරි නිපදවීම | | | |
| 19. පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 20. එළවළු ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 21. අළුත් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 22. ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | | | |
| 23. ශීත කළ මස් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 24. බිත්තර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 25. පුද්ගලික මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | | | |
| 26. සංචාරක මාළු අලෙවිය | | | |
| 27. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| *අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම :* | | | |
| 01. ලොන්ඩරියක් පවත්වාගෙන යාම | | | |
| 02. රතිඤ්ඤා නිපදවීම | | | |
| 03. බැටරි චාර්ජ් කරන ස්ථානයක් සඳහා | | | |
| 04. වෑල්ඩින් කිරීම හා ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම | | | |
| 05. මෝටර් රථ අළුත්වැඩියා කිරීම | | | |
| 06. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 07. බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 08. මෝටර් වාහන බොඩි ගැසීමේ ගරාජයක් පවත්වාගෙන යාම | | | |
| 09. ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | | | |
| 10. ට්‍රේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | | | |
| 11. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | | | |
| 12. සිමෙන්ති ගබඩා කිරීම හා ගබඩා කිරීම | | | |
| 13. නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය කුළු බඩු තොග වශයෙන් පවත්වාගෙන යාම | | | |
| 14. යතුරු පැදි අළුත්වැඩියාව | | | |
| 15. යකඩ භාණ්ඩ නිෂ්පාදනය | | | |

**2011 වර්ෂය සඳහා 150 වගන්තිය යටතේ ඇතැම් වෙළඳාම් හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු පැනවීම - කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පැනවූ ඇතැම් වෙළඳාම් සහ කර්මාන්ත සම්බන්ධ බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2011 ජූනි මස 29 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 4-21 යටතේ යෝජනා සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**2 වැනි උපලේඛනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 150(1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත සම්බන්ධ බදු ඃ

1. ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පැවැත්වීම
2. ගීත පටිගත කරන ස්ථානයක් පැවැත්වීම
3. රෙදි විකුණන සාප්පුවක් පැවැත්වීම
4. සාප්පු බඩු විකුණන ස්ථානයක් පැවැත්වීම
5. කැසට් වර්ග කුලියට දෙන ස්ථානයක් පැවැත්වීම
6. දුරකථන ඇමතුම් ලබා දෙන ස්ථානයක් පැවැත්වීම
7. ඡායාස්ථ පිටපත් ගැනීම, රෝනියෝ කිරීම, ටයිප් කිරීම වැනි කටයුතු සඳහා ස්ථානයක් පැවැත්වීම
8. ප්‍රචාරක දැන්වීම් බෝඩ් ඇදීම
9. ශබ්දවාහිනී යන්ත්‍ර, බල්බ් වේදිකා කුලියට සැපයීම
10. උත්සව භාණ්ඩ කුලියට සැපයීම
11. රියදුරු පුහුණු ආයතනයක් පැවැත්වීම
12. ළදරු පාසැලක් (මුදල් අයකර) පැවැත්වීම
13. මුදල් අයකර අමතර ඉගැන්වීම් පන්තියක් පැවැත්වීම
14. දර විකුණන ස්ථානයක් පැවැත්වීම
15. ඉංග්‍රීසි බෙහෙත් විකුණන ස්ථානයක් (ෆාමසියක්) පැවැත්වීම
16. සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පැවැත්වීම
17. බුලත් විකුණන ස්ථානයක් පැවැත්වීම
18. මෝටර් රථ අමතර කොටස් විකිණීම
19. තෑගි භාණ්ඩ විකිණීම
20. මෝටර් බයිසිකල් පාපැදි අමතර කොටස් විකිණීම
21. විසිතුරු මල් වර්ග පැලෑටි වර්ග විකිණීම
22. පින්තූර රාමු කිරීම
23. ඇඳුම් මැසීම
24. පුවත්පත් සඟරා විකිණීම
25. කුෂන් වැඩපලක් පැවැත්වීම
26. ග්‍රොසරියක් පැවැත්වීම
27. ප්‍රවාහන කටයුතු සඳහා ඒජන්සියක් පැවැත්වීම
28. විදුලියක් නිපදවන ස්ථානයක් පැවැත්වීම
29. අන්තර්ජාල පහසුකම් සැපයීම
30. පොත්පත් විකුණන ස්ථානයක්
31. නාමපුවරු විකුණන ස්ථානයක්
32. පාවහන් විකිණීම

| උපරිමය | උපරිමය | උපරිමය |
|---|---|---|
| 500 0 | 500 -750 | 750 -1000 |

**3 වැනි උපලේඛනය**

2011 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ ඇතැම් වෙළඳ ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් බදු පැනවීම ඃ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පෙර වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ ආදායම අනුව පහත උපලේඛනයේ දැක්වෙන අනුප්‍රමාණ නොඉක්මවන බද්දක් අය කිරීම 2010 ජූනි මස 29 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 04-21 යටතේ යෝජනා සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම ගෙවා ව්‍යාපාර හා වෘත්තීය සඳහා බලපත්‍ර ගාස්තු ලබා ගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | *I තීරය* | *II තීරය* රු. ශත |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| 02. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 04. | රු.18,750 ඉක්මවන එහෙත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන එහෙත් රු.150,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 06. | රු. 150,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

*වෘත්තීය හා ව්‍යාපාර බදු මුදල් අයකිරීම සඳහා ව්‍යාපාර :*

01. කොමිස් ඒජන්තවරුන්
02. වෙන්දේසි හා තැරව්කරුවන් ලෙස ක්‍රියාකිරීම
03. බඩු උකස් ගන්නෙකු ලෙස ක්‍රියාකිරීම
04. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම
05. ගණන් පරීක්ෂවරයෙකු ලෙස ක්‍රියා කිරීම
06. ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස ක්‍රියාකිරීම
07. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ක්‍රියාකිරීම
08. මුදල් ණයට දෙන්නෙකු ලෙස ක්‍රියාකිරීම
09. ප්‍රධාන සේවා අයිතිකරුවෙකු හෝ ඒජන්තවරයෙකු ලෙස ක්‍රියාකිරීම
10. ආදායම් බදු හෝ කම්කරු නීති උපදේශයෙකු ලෙස ක්‍රියාකිරීම
11. මිනින්දෝරු කාර්යාලයක් පවත්වාගෙන යාම
12. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
13. නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
14. බටහිර වෛද්‍ය විශේෂඥ සේවාවක් පවත්වාගෙන යාම
15. දේශීය වෛද්‍ය විශේෂඥ සේවාවක් පවත්වාගෙන යාම
16. දන්ත වෛද්‍ය ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
17. ලොතරැයි ඒජන්තවරයෙකු ලෙස ක්‍රියාකිරීම
18. රේස් ඔට්ටු භාරගන්නා තැනැත්තවුන් ලෙස ක්‍රියාකිරීම
19. වාණිජ බැංකු ග්‍රාමීය බැංකු පවත්වාගෙන යාම
20. විදේශ රැකියා ඒජන්තවරයෙකු ලෙස ක්‍රියාකිරීම
21. භාණ්ඩ ආනයනකරුවෙකු ලෙස ක්‍රියාකිරීම
22. භාණ්ඩ අපනයනකරුවෙකු ලෙස ක්‍රියාකිරීම
23. පුද්ගලික ආරෝග්‍යශාලා පැවැත්වීම
24. පුද්ගලික අධ්‍යාපන පන්ති පැවැත්වීම
25. විදුලි සංදේශ කුළුණු

10-281/1

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තිය යටතේ අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තිය ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ වරිපනම් බදු අය නොකරන ප්‍රදේශවල පිහිටියාවූ ද, වගාකළ ඉඩම්වලින් ඇමතිතුමාගේ අනුමැතිය ප්‍රකාර හෙක්ටයාර 1 සිට 5 දක්වා රු. 50ක අක්කර බද්දක් පනවා ඊට වැඩිවන සෑම හෙක්ටයාරයකටම රු. 10.00 ක අක්කර බද්දක් පනවා 2011 මාර්තු 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු අවසන් වීමට පෙර ගෙවිය යුතු බවට මෙයින් දැනුම් දෙනු ලැබේ. තව ද මෙම පනතේ 134(7) වගන්තිය ප්‍රකාර පහත පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට පහත සඳහන් වට්ටම් මුදල් ප්‍රදානය කරනු ලබන බව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2010 ජූනි 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 04-21 යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) 2011 ජනවාරි 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම අදාල අක්කර බදු මුදල ගෙවුවහොත් එම මුදලින් 10%ක්,

(ආ) අක්කර බද්ද කාර්තු වශයෙන් ගෙවන විට කාර්තුවේ මුල් මාසය තුළ ගෙවනු ලැබුවහොත් එම මුදලින් 5%ක්.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 17 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-281/4

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා විනෝද බද්ද

විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ පළමුවැනි උපවගන්තිය අනුව 2011 ජනවාරි මස 01 වැනි දින සිට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුදල් අයකර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට දර්ශන, සර්කස් දර්ශන, මැජික් දර්ශන, වීඩියෝ පට දර්ශන, සංගීත දර්ශන, කරාටේ, ජූඩෝ ආදී වෙනත් ඕනෑම දර්ශනයක් වෙනුවෙන් එම දර්ශන සඳහා නිකුත් කරන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් සියයට විස්සක(20%) විනෝද බද්දක් පනවා අයකිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2010 ජූනි මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 04-21 යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 01. | ලිත් වර්ෂයකට | 3,500 0 |
| 02. | මාස 06කට | 2,500 0 |
| 03. | මාස තුනකට | 1,500 0 |
| 04. | එක් මාසයකට | 750 0 |
| 05. | එක් දිනකට | 100 0 |

වැඩි වන්නාවූ සෑම දිනකටම රු. 200ක් අය කෙරේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 17 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-281/2

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2011 වර්ෂය සඳහා අයකිරීමත් එය 2011 මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවටත්, 2011 ජූනි මස 29 වැනි දින රැස්වූ මහ සභාවේ යෝජනා අංක 04-21 යටතේ සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 17 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | රු. ශත |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා, සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් - | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (ඇ) සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| (ඈ) සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (ඉ) සෑම අශ්වයෙකු සඳහා, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| (ඊ) සෑම ඇතෙකු සඳහාම | 50 0 |

10-281/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.